# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1981 ඔක්තෝබර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

## 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 49/80.

**1960 අංක 5 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1961 අංක 8 දරන පනතින් සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතෙහි 5 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ පනත, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1960 අංක 5 දරන පනතෙහි 5අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ආධාර නොලබන පාඨශාලාවලට මූල්‍ය ආධාර.

5අ. (උපකෘත අභ්‍යාස විද්‍යාලයක් නොවන) I වන ශ්‍රේණියේ හෝ II වන ශ්‍රේණියේ උපකෘත පාඨශාලාවක්ව තිබුණු යම් ආධාර නොලබන පාඨශාලාවක අයිතිකරු විසින්, 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, ඒ පාඨශාලාව ආධාර නොලබන පාඨශාලාවක් ලෙස පරිපාලනය කිරීමට තෝරා ගෙන ඇති බවට වූ ලිඛිත දැන්වීමක්, 3 වන වගන්තිය යටතේ සාදනු ලැබ පළ කරනු ලැබූ නියමයෙහි සඳහන් කරනු ලද දිනයට පෙර, යම් වේලාවක දී අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවක, මේ පනතේ 5 වන වගන්තියෙහි කුමක් සඳහන් ව ඇත ද, අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ පාඨශාලාවට රජයේ අරමුදලින් කරනු ලබන ප්‍රදාන වශයෙන්, මූල්‍ය ආධාර දෙනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ දෙනු ලබන යම් ආධාරයක්, අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි, ඒ සියලු පාඨශාලා සම්බන්ධයෙන් අදාළ වන්නා වූ, ඒ කොන්දේසිවලට යටත් විය යුතු ය.".

3. මේ පනතේ 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධනය, 1980 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. සංශෝධනය අතීතගාමී බලපෑම.

ඒ 58244—15,350 (81/08)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 60 කි, (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.